ප්‍රතිඵලයෙන් මා කිසිසේත් ම වික්ෂිප්තභාවයට පත්වන්නේ නැහැ. ඒ වාගේම මා මෙය කිසිසේත් ම අනපේක්ෂිත ප්‍රතිඵලයක් ලෙස සලකන්නේත් නැහැ. මේක තමයි අද අපේ රටේ පාර්ලිමේන්තුවේ පෙන්නුම් කරමින් තිබෙන සංයුතියේ ස්වභාවය. මම විශ්වාස කරන විධියට, මේ පාර්ලිමේන්තුව තුළ, මේ ඉලක්කම් ඇතුළේ; මේ සංඛ්‍යා දත්ත ඇතුළේ පෙන්නුම් කරන සංයුතිය නොවෙයි, අද සැබැවින්ම මහ පොළොවේ පෙන්නුම් කරන්නේ. ජනතාවගේ සාධාරණ කැමැත්තේ පිළිබිඹුවක් අද මෙම පාර්ලිමේන්තුව තුළ දිස්වුණා කියලා කවුරු හෝ විශ්වාස කරනවා නම්, ඒක මුළුමනින් ම මිථ්‍යාවක්. අද මේ පාර්ලිමේන්තුව තුළ පෙන්නුම්කොට තිබෙන්නේ ජනතාවගේ කැමැත්තේ විකෘති වූ පිළිබිඹුවක්. එළියේ ජනතාවත්, මේ සභා ගර්භයේ ඔබතුමන්ලාත් අතර විශාල පරස්පරතාවක් නිර්මාණය වී තිබෙන බව මතක තබාගන්න. අද එළියේ ජනතාවත්, මේ සභාවත් අතර විශාල ප්‍රතිවිරෝධයක් නිර්මාණය වී තිබෙනවා. හැබැයි, මීට වඩා කිසිවක් මේ පාර්ලිමේන්තුවෙන් මා අපේක්ෂා කරන්නේ නැහැ. මොකද, ඒ තත්ත්වය ඇති වූ වහාම අපි සියලු දේශපාලන ව්‍යාපාර, කණ්ඩායම් මුණ ගැසුණා. එම කණ්ඩායම්වලට ඉදිරිපත් කළ අපේ යෝජනාව වුණේ කුමක්ද? ජනාධිපති ධුරය සහ අග්‍රාමාත්‍ය ධුරය සඳහා ඉදිරි දේශපාලන බල ව්‍යාපෘතියකට සම්බන්ධ නොවන දෙදෙනෙකු තෝරා ගනිමු කියලා මා කිව්වා.

ගරු කථානායකතුමනි, විටෙක ඔබතුමාගේ නම ද ඒ සඳහා යෝජනා වුණා. අග්‍රාමාත්‍ය ධුරය සඳහා උතුරේ මන්ත්‍රීවරයකුගේ - මා හිතන විධියට සුමන්තිරන් මන්ත්‍රීතුමාගේ- නමත් යෝජනා වුණා. මෙවැනි අර්බුදයකදී එය අපේ රටට මහඟු ආදර්ශයක් බවට පත් කරගත හැකිව තිබුණා. මා ගරු කිරීමක් හැටියට මේ කාරණය කියන්නට ඕනෑ, ගරු කථානායකතුමනි. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීවරයා සමඟ අප සිදු කළ සාකච්ඡාවලදී එතුමා යෝජනාවක් ඉදිරිපත් කළා, මේ තනතුරු දෙක පාර්ලිමේන්තුව නියෝජනය කරන කාන්තාවන් දෙදෙනෙකුට ලබා දෙන්න ඕනෑය කියලා. මොකද, මෙවැනි අර්බුදයකදී හැර මෙවැනි ආදර්ශවත්, වගකීම් සහිත අවස්ථාවක් මේ රටේ මැතිවරණයකදී අපට නිර්මාණය කර ගන්න බැහැ කියන එක අපි දන්නවා. මෙවැනි අර්බුද අවස්ථාවක දී, ජනාධිපති ධුරය සහ අග්‍රාමාත්‍ය ධුරයට පත් කිරීමේදී මේ එක් තනතුරක් හෝ අනාගත දේශපාලන අරමුණක් නොමැති, උතුර නියෝජනය කරන දෙමළ මන්ත්‍රීවරයෙකුට ලබා දිය හැකි නම් මේ සභාව පිළිබඳව අපේ රට තුළ ඇතිවන ගෞරවය සහ විශ්වාසය කොතරම්ද? ඒ වාගේම ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා යෝජනා කළ ආකාරයට එම තනතුරු දෙක සඳහා කාන්තාවන් දෙදෙනෙකු තෝරා ගත හැකිව තිබුණා නම්, එම යෝජනාවට අපි පක්ෂපාතී වෙනවා. එය මේ රටට මොනතරම් ආදර්ශයක් බවට පත් වේවිද? අන්න එවැනි, අනාගත බල ව්‍යාපෘතියක් එක්ක සම්බන්ධ නොවන ආණ්ඩුවක, ඒ දෙදෙනාගේ ඉහළ තනතුරු දෙක අනාගත බල ව්‍යාපෘතියක් එක්ක සම්බන්ධ නොවනවා නම්, ඒ හැදෙන ආණ්ඩුව ඇතුළේ අමාත්‍ය ධුර සහ වග කීම් භාර ගන්න සූදානම් බවත් අපි ප්‍රකාශ කළා. හැබැයි, එය යම් කෙටි කාලයකට පමණක් වලංගු විය යුතුයි කියා කොන්දේසියක් තිබුණා. එය මාස හයක් හෝ අපට සාකච්ඡා කරගත හැකි කාලයක්. ඇයි, අප විසින් එවැනි යෝජනාවක් කරන්නේ? අද රටේම ජනතාව කියන්නේ කුමක්ද? රට විශාල ව්‍යසනයකට පත් වී තිබෙනවා. මිනිස්සු පෝලිම්වල මියැදෙනවා. දරුවන්ට කිරි පිටි නැහැ. මේ නිසා අපි විශාල අර්බුදයකට මුහුණ දෙමින් සිටිනවා. ගොවීන් තමන්ගේ නාටු වූ කුඹුර දිහා බලාගෙන හුල්ලමින් ඉන්නවා. ධීවරයන් වැල්ලට ගොඩ ගසන ලද තමන්ගේ බෝට්ටුව දිහා බලාගෙන කනස්සල්ලෙන් ජීවත් වෙනවා. තරුණ පරම්පරාව තමන්ගේ අනාගතය පිළිබඳව විශාල අපේක්ෂා භංගත්වයකට පත් වී තිබෙනවා. දුවා දරුවන් තමන්ගේ අධ්‍යාපනයට කවර අනාගතයක් උරුම වේවිද කියා හිතමින් කනස්සල්ලෙන් ඉන්නවා. හැම දෙයක්ම විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. අන්න, එවැනි අවස්ථාවකදී මේ පාර්ලිමේන්තුවට මහඟු අවස්ථාවක් උදා වුණා, රටේ ඉහළම තනතුරු දෙක අනාගත බල ව්‍යාපෘතියකට සම්බන්ධ නැති දෙදෙනෙකුට ලබා දීලා, ඒකාබද්ධ කැබිනට් මණ්ඩලයක් හරහා කෙටි කාලයකට මේ රට පාලනය කරන්න.

ඒක තමයි අපේ යෝජනාව බවටත් පත් වුණේ. හැබැයි, අපේ යෝජනාවේ කරුණු දෙකක් ගැබ් වී තිබෙනවා, ගරු කථානායකතුමනි. එම යෝජනාව යථාර්ථයක් බවට පත් වෙන්නේ නම් කැබිනට් මණ්ඩලය අමාත්‍ය ධුර දහයකට පමණක් සීමා විය යුතුයි කියන ස්ථාවරයේ අපි හිටියා. එම අමාත්‍ය ධුර දහය ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් සකස් කර තිබුණාය කියලා මා හිතනවා. ඒ වාගේම එහි කාලය සීමා විය යුතුයි කියන එකත් අපේ යෝජනාව තුළ ගැබ් වී තිබුණා. අන්න ඒ මූලික හරයම තමයි එම යෝජනාව පරාජයට පත් වෙන්න හේතු වෙන්නේ. ඒ නිසා එම යෝජනාව පරාජයට පත් වුණා. එම යෝජනාව පරාජයට පත් වුණාට පසුව, මේ ඇති වී තිබෙන තත්ත්වයෙන් ලබා ගත හැකි මහඟු ප්‍රතිඵල, මහඟු ආදර්ශ, මහඟු මැදිහත්වීම් මේ පාර්ලිමේන්තුව තුළින් උත්පාදනය කර ගන්න අපි උත්සාහ කළත්, ඒකත් අසාර්ථක වුණා. ඒ උත්සාහයත් අසාර්ථක වුණාට පසුව අපේ ප්‍රතිපත්ති, අපේ අනන්‍යතාව, අපේ වුවමනාව හා අපේ වැඩ පිළිවෙළ මත පදනම්ව මා මෙම තරගයේ අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වුණා. මම අපේක්ෂකයෙකු හැටියට ඉදිරිපත් වනවිටම දන්නවා, මෙය තමයි මාහට හිමි වන ප්‍රතිඵලය කියලා. එම ප්‍රතිඵලය මා කිසිසේත්ම වික්ෂිප්තභාවයට පත් වන ප්‍රතිඵලයක් නොවන බවත් මා දන්නවා. හැබැයි, අද ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද? මහත් ආන්දෝලනයකට තුඩු දෙන බොහෝ සිදුවීම් මේ ගරු සභා ගර්භය තුළ සිදු වී තිබෙනවා. දෙමළ ජාතික සන්ධානය, ස්වාධීන වූ පක්ෂ දහයක්, ස්වාධීන වූ තව කණ්ඩායමක්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වාගේම සජබය ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමාගේ පිල හැටියට ප්‍රකාශයට පත් කරනවා මා දැක්කා. එහෙම බැලුවාම, කණ්ඩායම් ප්‍රමාණයෙන්ම 113 ඉක්මවා යන්න පුළුවන් කියා මට හිතුණා. හැබැයි, ඒ ප්‍රකාශයට පත් වූ දේ ඇතුළේ සැබැවින්ම එම සාමාජිකයන්, එම කණ්ඩායම් එම තීන්දුවල රැඳෙනවාද? එම තීන්දුවල නොරැඳෙන්නේ ප්‍රතිපත්තිමය කරුණු මත විතරක්ද? ඔවුන් එම තීන්දු-තීරණවල නොරැඳෙන්නේ ප්‍රතිපත්තිමය සාධක මත පමණක් නොවෙයි කියා මා විශ්වාස කරනවා. පාර්ලිමේන්තු ඉතිහාසයේ එවැනි අවස්ථා අප ඕනෑ තරම් දැක තිබෙනවා. ඉතාම තීරණාත්මක අවස්ථාවලදී, - පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අවශ්‍ය වූ අවස්ථාවලදී - මට මතක විධියට දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න අවස්ථාවේ දීත්, දින 52 කුමන්ත්‍රණය පැවති අවස්ථාවේ දීත්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්නා අවස්ථාවේ දීත් මන්ත්‍රීවරුන් ඕනෑ තරම් එහාට මෙහාට අළෙවි වුණු ඉතිහාසයක් මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. මන්ත්‍රීවරු විකිණෙනවා, හරියට ගමක තිබෙන තේක්ක ගහක් වට අඩි ගණනට විකුණනවා වාගේ. ඒ වාගේම ඇඟ අනුවත් විකිණෙනවා. මම හිතනවා, මේකත් එහෙමයි කියලා. කෙනෙක් කියන්න පුළුවන්, "නැහැ" කියලා. ඒ "නැහැ" කියන එකත් මම භාර ගන්නම්. *[බාධා කිරීම්]* හරි, මේක මගේ අදහස. *[බාධා කිරීම්]* මේක මගේ අදහස. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා මෙහෙම කලබල වෙන බවත් මා දන්නවා. නමුත් මේ කරුණ මේ සභාවේදී කියන්නේ